**ශීර්ෂය 195 - සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

**----------------------------------------------------------------------------------------------------------------**2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශිර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශනය, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

**------------------------------------------------------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

**---------------------**

ශිර්ෂය 195- සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනිම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

**---------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංවර්ධන උපායමාර්ග හා හ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල

සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණ වලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණි. මේවා නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| ------------------------------------------------- | | ---------------------------- | ----------- |
| මුදල් රෙගුලාසි<br>------------------ | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම. | 2.2.1 |
| | | 3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.9 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම් | 2.10 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | |
| | | 3. කළමනාකරණ දුර්වලතා | 2.11 |
| | | | 2.6 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. ඉන්ධන දහනය පරික්ෂා නොකිරීම | 2.3 (අ) |
| | | 2. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.3 (ඇ) |
| | | 3. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම. | 2.3 (ඇ) |
| | | 4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නොපැවැත්වම | 2.3 (ආ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම් වලට එළඹීම | 2.4 |
| | | 2. අග්‍රිම අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් | 2.8 |
| 127(5) | ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | | |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම | පාඩු හා හානි | 2.5 |

පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

**සැලැසුම් කිරිම**

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 26 ක් පැවැති අතර, අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 04ක, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර සමාලෝචිත වර්ෂයේදී යාවත්කාලීන කර තිබුණද එම කාර්යය ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර නොතිබුණි.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය අවසානයේදී නැවත සංශෝධනයට ලක්කර තිබුණද භාණ්ඩාගාරය වෙත දැනුම් දී නොතිබීම නිසා මූලික ක්‍රියාකාරී සැලැස්ම මත අනුමත වූ ප්‍රතිපාදන සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව සංශෝධනය වී නොතිබුණි.

(iii) මූලික ක්‍රියාකාරී සැලැස්ම තුල එක් යෝජිත ක්‍රියාකාරකමක් ඉටුකිරීම සඳහා පමණක් පිරිවැය ඇස්තමේන්තුකර තිබුණු අතර සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම තුල ක්‍රියාකාරකම් කිසිවක් සඳහා පිරිවැය ඇස්තමේන්තුගතකර නොතිබුණි.

(iv) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) පිළියෙල කර නොතිබුණි .

(ආ) තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" අනුව අමාත්‍යාංශය විසින් සිය විෂය පථයට අනුව ළඟාකරගතයුතු අරමුණු වශයෙන් තිරසර සංවර්ධන අරමුණු වන අරමුණු 8, 9 හා17 හඳුනාගෙන තිබුණි. එසේ නමුත් අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන අනෙකුත් අරමුණු සම්බන්ධයෙන් පූර්ණ විශ්ලේෂණයක් අමාත්‍යාංශයේ ඉහළ කළමනාකාරීත්වය විසින් සිදුකර නොතිබුණි.

කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 45.38 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 42.88 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | **සැපයීම්** | | | |
| 1201 | - ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3.00 | 2.98 | 0.02 |
| 1203 | - ආහාර පාන හා නිල ඇඳුම් | 0.38 | 0.34 | 0.04 |
| 1205 | - වෙනත් | 0.20 | 0.20 | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2101 | - වාහන | 36.00 | 35.28 | 0.72 |
| 2102 | - ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 2.80 | 2.19 | 0.61 |
| 2103 | - යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 3.00 | 1.89 | 1.10 |
| | එකතුව | 45.38 | 42.88 | 2.49 |

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය

-----------------------------------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 45.38ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 42.88 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද එහි එක් එක් ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධයෙන් විස්තර ඇතුළත් කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන පැකේජ සාරාංශය සකස් කර නොතිබුණු අතර ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්ම ද සකස් කර නොතිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු

-----------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හම්බන්තොට වරාය සහ කාර්මික කලාපය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීමේ මාධ්‍ය ප්‍රචාරණය**

-----------------------------------------------------------------------------------------

2017 වර්ෂය තුළදී හම්බන්තොට වරාය සහ කාර්මික කලාපය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩ සටහනක් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු අතර මේ සඳහා රූපවාහිනි, ගුවන් විදුලි හා පුවත්පත් මගින් මහජනතාව දැනුවත් කිරීම වෙනුවෙන් රු.18 ,853, 894 ක (VAT සහ NBT සහිත) මුදලක් මාධ්‍ය ආයතන වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ප්‍රසම්පාදන කාර්යවාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලින් හෝ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුලින් අනුමත වී නොතිබුණි.

(ii) මෙම කාර්යය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ඇස්තමේන්තුවක් ද 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර ද පිළියෙල කර නොතිබුණි.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් හා ප්‍රසම්පාදන සැලැස්ම මගින් මෙම ප්‍රසම්පාදන කාර්ය අනුමත වී නොතිබුණි.

(iii) 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සඳහා වූ අතිරේඛ අංක 28 ප්‍රකාරව භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමේදී මුද්‍රා තැබූ මිල ගණන් 03 කට නො අඩු සංඛ්‍යාවක් කැඳවන අවස්ථා වලදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සඳහා අධිකාරි සීමාව රු.මිලියන 08 ක් පමණක් වන බව සඳහන් වන නමුත් අමාත්‍යාංශය එම අධිකාරි සීමාව ඉක්මවා කටයුතු කර තිබුණි.

(iv) මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා අන්තර්ජාලයේ ඇතුළත් පිළිගත් ආයතන 03 කින් මිල ගණන් කැඳවා ඇති අතර එම ආයතන තෝරා ගැනීමේදී රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබා දී නොතිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව අදාල විෂය පිළිබඳ විශේෂඥයෙකු ඇතුළත් කර නොතිබුණි.

(vi) මෙම කාර්ය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3 ප්‍රකාරව සම්මත ලංසු කැඳවීමේ ලේඛන භාවිතා කළ බවට සාක්ෂි නොවූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි.

(vii) තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව විසින් ඉහත කාර්යය සඳහා රු.16,208,705 ක (VAT සහ NBT රහිත) කොන්ත්‍රාත්තු මුදලක් යටතේ පෞද්ගලික මාධ්‍ය නියෝජිතායතනයක් තෝරාගෙන තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කළ බවට සාක්ෂි නොවීය.

(viii) මෙම කාර්යය ඉටුකිරීම වෙනුවෙන් තෝරාගත් නියෝජිතායතනය වෙත රු.9,704,546 ක් පමණක් ගෙවීම් කර තිබුණි. එසේම ඉතිරි රු.9,149,348 ක ප්‍රසම්පාදනයෙන් තෝරාගත් නියෝජ්‍ය ආයතන වෙත ගෙවීම් නොකර සේවා සැපයීම සඳහා යොදාගත් මාධ්‍ය ආයතන වෙත ගෙවා තිබුණි.

(ix) ඉහත සඳහන් ගෙවීම් කිරීමේදී විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද විකාශන කාලය හා වාර ගණන සම්බන්ධයෙන් තහවුරු කරගත් බවට සාක්ෂි නොවීය.

**(ආ) 30 වන මහලෙහි පිහිටි අමාත්‍යාංශ කාර්යාලයේ කාමර වෙන්කිරීම**

**-------------------------------------------------------------------------**

30 වන මහලෙහි පිහිටි අමාත්‍යාංශ කාර්යාලයෙහි කාමර වෙන්කිරීම වෙනුවෙන් වූ රු.1,129,803 ක් වූ ප්‍රසම්පාදන කාර්යය සඳහා ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු ප්‍රසම්පාදන අත්පොතෙහි 6:3:6 හි සඳහන් නියමිත ආකෘති පත්‍රයක වාර්තාගතකර එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයන් විසින් අත්සන්කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:6(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් නිශ්චිත මුදලක් රඳවා තබා ගෙන නොතිබුණි.

**(ඇ) අනෙකුත් ප්‍රසම්පාදනයන්**

**------------------------------**

(i) 2016 පෙබරවාරි 16 දිනැති අංක 431(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව යානාපත්‍ර මිළදී ගැනීමේ සහ ගුවන් ගමන් සංවිධානය කිරීමේ කටයුතු සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇති පිළිගත් ගුවන් ගමන් නියෝජිත ආයතන වෙතින් විවෘත මිළ ගණන් කැඳවා රජය වැය කරන මුදලට උපරිම වටිනාකම් ලබාදෙන ආයතන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව තෝරාගත යුතුය. එසේ වුවද, අමාත්‍යාංශය විසින් අවස්ථා 05 කදී එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා යානා පත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් රු.3,876,200 ක් ගෙවා තිබුණි.

(ii) කාර්ය මණ්ඩලය සඳහා වූ බැහැරගත කණ්ඩායම් ක්‍රියාකාරකම් වැඩමුළුවක් සඳහා අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා පිළිබඳ පිරිවිතර සකස් කර මිළ ගණන් කැඳවීම වෙනුවට පෞද්ගලික ආයතන විසින් ඉදිරිපත් කරන ලද පුහුණු කිරීමේ යෝජනා මත සම්පත් දායකයින් තෝරාගෙන තිබුණි. එසේම සම්පත් දායකත්වය සඳහා රු.205,000 ක් ගෙවා තිබුණි. තවද සම්පත් දායකයින් තෝරාගැනීමේදී ඉදිරිපත් කරන ලද මිල ගණන් පමණක් ඇගයීමට ලක්කර තිබුණු අතර රජයේ ලියාපදිංචිය, සේවාවෙහි ගුණාත්මක බව සහ ප්‍රමිතිය පිළිබඳ කරුණු සලකා බැලූ බවට සාක්ෂි නොවීය.

**2.3 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂා සිදුකර නොතිබුණි. එමෙන්ම එම චක්‍රලේඛයේ ඇමුණුම ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් ඉන්ධන දහනය වීම ආර්ථිකව සිදු කළ බව තහවුරු නොවීය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2018 ජූලි 06 දින එනම් මාස 03 කට අධික කාලයක් ප්‍රමාද වී විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

අමාත්‍යාංශය වෙනත් පාර්ශවයන් සතු වාහන 04 ක් විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ගෙන තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.07 ක නඩත්තු පිරිවැයක් දරා තිබුණි. එසේම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු රු.මිලියන 3.69 ක පිරිවැයකින් යුත් ප්‍රාග්ධන භාණ්ඩ 341ක් 2017 දෙසැම්බර් 31 දිනටද අමාත්‍යාංශය පරිහරණය කරමින් පැවතුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

පැරණි අමාත්‍යාංශය වන මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිකර තිබුණු මෝටර් රථ 02 ක් නව අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.

**2.4 බැඳීම් හා බැරකම්**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳී සිටිය යුතු වුවද අමාත්‍යාංශය වැය විෂයයන් 16 ක ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා එකතුව රු.13,755,774 ක බැරකම් වලට බැඳී තිබුණි.

**2.5 පාඩු හා හානි**

අමාත්‍යාංශයේ 2017 වර්ෂයේදී සිදුවූ රිය අනතුරු 10 ක් වෙනුවෙන් රු.2,434,136 ක අළුත්වැඩියා වියදමක් දරා තිබුණු අතර ඉන් රු.2,017,455ක මුදලක් රක්ෂණයෙන් පියවාගෙන තිබුණි. ඒ අනුව රු.384,314 ක පාඩුවක් සිදු වී තිබුණි. මුදල පියවා ගැනීම සඳහා අමාත්‍යාංශය 2018 ඔක්තෝබර් 05 දින වන විටත් අදාල විමර්ශන කටයුතු සිදුකර අදාල වගකිව යුතු නිලධාරීන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණේ 30 වන මහලේ වර්ග අඩි 3886 ක අමාත්‍යාංශයේ කාර්යාල පවත්වා තිබුණි. නව ගිවිසුමකට එළඹීමකින් තොරව 2017 මාර්තු 15 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ගොඩනැගිලි කුලී වශයෙන් රු.මිලියන 16.02 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ එක්සත් රාජධානියේ පවත්වන ලද පුහුණු වැඩසටහනක් සඳහා සහභාගි වූ නීතිපති දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරියෙකු වෙනුවෙන් ගුවන් ටිකට්පත් වියදම හා ගුවන් ටිකට්පත් දින වෙනස් කිරීමේ වියදම වශයෙන් රු.230,000 ක් ද , චීනය හා ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුම 6 වන සාකච්ඡාව සඳහා සහභාගි වූ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකු වෙනුවෙන් රු 650,450 ක්ද අමාත්‍යාංශය විසින් දරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බ්‍රසල්හි පවත්වන ලද වැඩමුළුවක් සහ ඉන්දියාවේ පවත්වන ලද ඉන්දු ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම හා සම්බන්ධ හතරවන වටයේ සාකච්ඡාව සඳහා සහභාගි වූ අමාත්‍යාංශයේ නිලධාරින් සඳහා 2015 මැයි 15 දිනැති අංක මු. අ. 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 03 (ආ) වගන්තිය ප්‍රකාරව එතෙරදී දරනු ලබන ගමන් වියදම් ඇතුළු අනෙකුත් වියදම් පියවා ගැනීම සඳහා අනියම් දීමනා ලෙස දිනකට .එ.ජ.ඩොලර් 75 බැගින් ගෙවා තිබුණි. එසේ වුවද, එරටදී ප්‍රවාහනය සඳහා වැය වූ වියදම් ලෙස පිළිවෙලින් රු.256,078 ක් සහ රු.137,500 ක් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ඈ) ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු අනුමැතිය යටතේ 2016 වර්ෂයේදී සංවර්ධනය සඳහා වූ නියෝජිත ආයතනය සහ ජාත්‍යන්තර වෙළඳාම සඳහාවූ නියෝජිත ආයතනය පිහිටුවා තිබුණි.එසේ වුවද ආයතන බලාත්මක කිරීම සඳහාවූ පනත 2017 දෙසැම්බර් 31 දින දක්වාත් පාර්ලිමේන්තුවේ සම්මතකර නොතිබුණු නමුත් අමාත්‍යාංශය විසින් මෙම ආයතනවල කටයුතු වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.18,348,930ක මුදලක් වැයකර තිබුණි.මෙම මුදලින් සියයට 53 ක් නියෝජිතායතන කමිටු සාමාජිකයින්ගේ විදේශ ගමන් සඳහා වැයකර තිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2014 | පුනරාවර්තන | 125.29 | 99.23 | 26.06 | 20.80 |
| | මූලධන | 48.71 | 42.86 | 5. 85 | 11.27 |
| | **එකතුව** | **174** | **142.09** | **31.91** | **18.34** |
| 2015 | පුනරාවර්තන | 353.59 | 343.79 | 9.80 | 2.77 |
| | මූලධන | 359.49 | 195.97 | 163.52 | 45.49 |
| | **එකතුව** | **713.08** | **539.76** | **173.32** | **24.31** |
| 2016 | පුනරාවර්තන | 565.90 | 537.63 | 28.27 | 5.00 |
| | මූලධන | 473.00 | 177.00 | 296.00 | 62.58 |
| | **එකතුව** | **1038.90** | **714.63** | **324.27** | **31.21** |
| 2017 | පුනරාවර්තන | 585.69 | 503.59 | 82.11 | 14.02 |
| | මූලධන | 1379.80 | 550.95 | 828.85 | 60.07 |
| | **එකතුව** | **1965.49** | **1054.54** | **910.96** | **46.35** |

සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම
---------------------------------------------------------

(i) 2015, 2016 සහ 2017 යන වර්ෂ වලදී සමස්ත මූලධන ප්‍රතිපාදනයෙන් පිළිවෙළින් සියයට 45.49 ක්, සියයට 62.58 ක් සහ සියයට 60.07 ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයෙන් වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 0.3ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(iii)

(ඇ) සමාලෝචිත වර්ෂයෙන් වැය විෂයයන් 29 ක් සඳහා එකතුව රු.මිලියන 876.67 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 571.21 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය රු.මිලියන 305.46 ක් විය. එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.8 අග්‍රිම ගිණුම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 05කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.127,500 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස 01 ක සිට මාස 05 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

(ආ) විශේෂ කාර්යයක් සඳහා අත්තිකාරම් ලබා දීමේදී අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා රු.136,764 ක අතිරික්ත මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණු අතර කාර්ය අවසන් වූ වහාම ඉතිරි මුදල් නොපියවා දින 7 සිට 22 දක්වා ප්‍රමාදයකින් පසු අත්තිකාරම් පියවා තිබුණි.

**2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි.

**2.10 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23.5.1. වගන්තිය | | අවස්ථා 03 කදී නිලධාරීන් දිවයිනෙන් බැහැරයාමට පෙර වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කර නොතිබුණි. |
| (ii) ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 11.1 වගන්තිය | 3,543,600 | නිලධාරීන් 07 දෙනෙකු අවස්ථා 19 කදී ජාත්‍යන්තර වශයෙන් පවත්වන ලද සාකච්ජා සඳහා විදේශගත වීමේදී ව්‍යාපාරික පන්තියේ ගුවන් ටිකට්පත් මිලදීගෙන තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 104(1)(අ),104(3),104(4) | 214,205 | අමාත්‍යාංශයේ වාහන අනතුරු 08 ක් සම්බන්ධයෙන් පිළියෙල කර ඉදිරිපත් කලයුතු වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 1641 | - | වාහනයක් අනාරක්ෂිතව විවෘත ස්ථානයක නවතා තැබීම හේතුවෙන් අනතුරකට ලක්ව තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645 | | අමාත්‍යාංශයේ වාහන පිළිබඳ ලොග් සටහන් පොත් යාවත්කාලීන කොට පවත්වාගෙන නොතිබුණි. |

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 120.23ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.561,837 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 19 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 238 | 176 | 62 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 14 | 03 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 04 | 04 | - |
| | එකතුව | **288** | **214** | **74** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**-------------------------------**

අමාත්‍යාංශයේ 214 ක කාර්ය මණ්ඩලය අතරින් අවම වශයෙන් වර්ෂයකට පැය 08 ක හෝ පුහුණුවක් ලබානොතිබූ නිලධාරීන් ගණන 195 ක් විය.